සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

71068

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම : ................................................ විභාග අංකය : ..................................

සැලකිය යුතුයි :

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- 01 සිට 20 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන වඩාත් සුදුසු නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

## I කොටස

(01) බෝධිසත්වයන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් පසු ව රුවන් සක්මන සිදු කරනු ලැබුවේ,
(1) පළමු සතියේ දී ය. (2) දෙවන සතියේ දී ය.
(3) තෙවන සතියේ දී ය. (4) පස් වන සතියේ දී ය.

(02) බුදුරජාණන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කරන ලද්දේ,
(1) බරණැස ඉසිපතනයේ දී ය. (2) බුද්ධගයාවේ දී ය.
(3) ලුම්බිණි සල් උයනේ දී ය. (4) වේළුවනාරාමයේ දී ය.

(03) බුද්ධ ශාසනයේ ප්‍රථම ආරාම පූජාව වන "වේළුවනාරාමය" බුදුරජාණන් වහන්සේට පූජා කරන ලද්දේ,
(1) අනේපිඬු සිටුතුමා ය. (2) විශාඛා මහෝපාසිකාව ය.
(3) බිම්බිසාර රජතුමා ය. (4) සුද්ධෝදන රජතුමා ය.

(04) ගිලානෝපස්ථානයේ දී උපස්ථායකයකු තුළ නොතිබිය යුතු ලක්ෂණයකි.
(1) රෝගියාට අවශ්‍ය බෙහෙත් පිළියෙළ කර දීම.
(2) ලාභ ප්‍රයෝජන අපේක්ෂාවෙන් යුතු ව කටයුතු කිරීම.
(3) මළ මුත්‍ර ආදිය කෙරෙහි පිළිකුල් නූපදවීම.
(4) රෝගියාගේ සිත සැනසෙන කථා පැවසීම.

(05) "සිව් සස් සිය නැණින්
දැන දුන් වී ය කුලුණින්...." යන පද්‍යයෙන් විස්තර වන බුදුගුණය වන්නේ,
(1) අරහං බුදු ගුණයයි. (2) බුද්ධ බුදු ගුණයයි.
(3) භගවා බුදු ගුණයයි. (4) සුගත බුදු ගුණයයි.

(06) සිරිත් විරිත් පැහැදිලි කරන පහත් අරමුණින් "කාව්‍ය ශේඛරය" රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?
(1) පැලෑනේ සිරි වජිරඥාන හිමි විසින් ය. (2) ඇස්. මහින්ද හිමි විසින් ය.
(3) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි විසින් ය. (4) වැත්තෑවේ හිමි විසින් ය.

(07) කරණීය මෙත්ත සූත්‍රයෙහි සඳහන් මෙත් වඩන්නෙකු සතු ගුණාංග ගණන,
(1) 10 කි. (2) 8 කි.
(3) 21 කි. (4) 15 කි.

(08) බුදු සසුනේ අග්‍ර දායිකාව හා අග්‍ර දායකයා ලෙස දැක්වෙන්නේ,

(1) විශාඛා සිටු දේවිය හා අනේපිඬු සිටුතුමා ය.

(2) කෝසල මල්ලිකා දේවිය හා අනේපිඬු සිටුතුමා ය.

(3) සුජාතා සිටු දියණිය හා සුදත්ත සිටුතුමා ය.

(4) විශාඛා සිටු දේවිය හා පූර්ණවර්ධන සිටුතුමා ය.

(09) අඥාන වන්ත වීමෙන් විනාශයට පත් වෙළඳ කණ්ඩායමක් හා ඥානවන්තව කටයුතු කිරීමෙන් සමෘද්ධියට පත් වෙළඳ කණ්ඩායමක් ගැන කියැවෙන ජාතක කථාව වන්නේ,

(1) සේරි වාණිජ ජාතක කථාවයි.

(2) අපණ්ණක ජාතක කථාව යි.

(3) සම්මෝදමාන ජාතක කථාවයි.

(4) සස ජාතක කථාවයි.

(10) සූත්‍ර පිටකයේ ධම්ම පදයට අයත් ගාථා සංඛ්‍යාව,

(1) 423කි. (2) 426කි.

(3) 523කි. (4) 526කි.

(11) දස පාරමිතා අතර සවැනි පාරමිතාව ලෙස දැක්වෙන්නේ,

(1) දාන පාරමිතාවයි. (2) සීල පාරමිතාවයි.

(3) ප්‍රඥා පාරමිතාවයි. (4) ඛන්ති පාරමිතාවයි.

(12) වැඩිහිටියන්ට නිති සැලකිලි දැක්වීමෙ දී අන්ධ වූ දෙමාපියන්ට හොඳින් සැලකූ පුතෙකු පිළිබඳ තොරතුරු දැක්වෙන්නේ,

(1) මාතුපෝසක ජාතකයේ ය. (2) සාම ජාතකයේ ය.

(3) වෙස්සන්තර ජාතකයේ ය. (4) ස්වර්ණහංස ජාතකයේ ය.

(13) උපයන ධනය යහපත් ලෙස යොදවන ආකාරය පංච බලි තුළින් දැක්වේ. එය ඇතුළත් සූත්‍ර ධර්මය වන්නේ,

(1) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයයි. (2) පත්තකම්ම සූත්‍රයයි.

(3) සිගාලෝවාද සූත්‍රයයි. (4) මහා මංගල සූත්‍රයයි.

(14) "ඒ ශ්‍රමණ ගෞතමයන් තමන් හමුවට එන අය ප්‍රිය වචනයෙන් පිළිගන්නේ ය." බුදුරජාණන් වහන්සේ පිළිබඳව මෙසේ ප්‍රකාශ කරන ලද්දේ,

(1) සෝණ දණ්ඩ බමුණා ය. (2) වාසෙට්ඨ බමුණා ය.

(3) ද්‍රෝණ බමුණා ය. (4) භාරද්වාජ බමුණා ය.

(15) රෝග හටගන්නා ක්‍රම පිළිබඳ ව ගිරිමානන්ද සූත්‍රයේ සඳහන් වේ. ඒ අනුව "කම්ම විපාකජා ආබාධා" යනුවෙන් අදහස් වනුයේ,

(1) අනුන්ගෙන් බෝවීම මගින් හට ගන්නා ආබාධයි.

(2) කර්ම විපාක නිසා හටගන්නා ආබාධයි.

(3) සෙම කිපීමෙන් හටගන්නා ආබාධයි.

(4) වැරදි පුරුදු නිසා හටගන්නා ආබාධයි.

(16) ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සීල ශික්ෂාවට අයත් වන්නේ,

(1) සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව

(2) සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා

(3) සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති

(4) සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි

(17) මිනිස් සබඳතාවලදී වචන භාවිතය පිළිබඳ ප්‍රධාන අංග 3ක් පිළිබඳ ''අභයරාජ සූත්‍රයේ'' සඳහන් වේ. එයට අයත් නොවන කරුණ නම්,

(1) කතා කරන කරුණ සත්‍ය විය යුතු ය.

(2) හේතු සාධක සහිත විය යුතු ය.

(3) අසන්නාගේත් කියන්නාගේත් යහපත පිණිස හේතු විය යුතු ය.

(4) තර්කානුකූල විය යුතු ය.

(18) තම නිවසට පැමිණි
සැමදෙන හට ම කුලුණෙනි
කතා බස් කරමිනි
අසන් තොරතුරු සුදුසු විදියෙනි''

මෙම කවිය ඇතුළත් ග්‍රන්ථය වනුයේ,

(1) සිරිත් මල්දමයි.
(2) සුභාෂිතයයි.
(3) ධම්මපදයයි.
(4) කව්සිළුමිණයි.

(19) පද්‍ය ග්‍රන්ථ අතුරින් දෙවන මහා කව ලෙස හඳුන්වන කාව්‍ය සංග්‍රහය වන්නේ,

(1) ලෝවැඩ සඟරාවයි.
(2) සිරිත් මල්දමයි.
(3) කාව්‍යශේඛරයයි.
(4) කව්සිළුමිණයි.

(20) බුදු දහම තුළින් නොකළ යුතු වෙළඳාම් 5 ක් දක්වා ඇත. ඒ අනුව නොකළ යුතු වෙළඳාම් පහෙන් වැළකීම අයත් වන්නේ,

(1) සම්මා කම්මන්තයි.
(2) සම්මා ආජීවයි.
(3) සම්මා වායාමයි.
(4) සම්මා සංකප්පයි.

ලකුණු $2 \times 20 = 40$

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

(01) ඔබ පංති කාමරයේ දී තෙවන වාරයට අදාළ පාසල් පාදක ඇගයීමට අනුව සිදු කළ ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන සඳහා ඔබ උපයෝගී කර ගත් පෙළපොතෙහි සඳහන් පාඩම කුමක් ද?

(ii) ඇගයීම සිදු කිරීම සඳහා ඔබට ලබා දුන් ගුරු උපදෙස් 2ක් ලියන්න.

(iii) මිහිඳු මහරහතන් වහන්සේ සමග ලක්දිවට වැඩම කළ රහතන් වහන්සේලා අතරින් දෙදෙනෙකුගේ නම් ලියන්න.

(iv) මිහිඳු මහ රහතන් වහන්සේ ලක්දිවට වැඩම කරන විට ලංකාවේ රජ කළ රජතුමා කවුරුන් ද?

(v) බුදු දහම වැළඳ ගැනීමෙන් පසු ජන ජීවිතයේ සිදු වූ වෙනස්කම් 2ක් ලියන්න.

(vi) බුදුරජාණන් වහන්සේ ශ්‍රී ලංකාද්වීපයට වැඩම කළ අවස්ථා ගණන කීය ද?

(vii) මහින්දාගමනයෙන් අපට ලැබුණු උතුමම දායාදය කුමක් ද?

(viii) මහින්දාගමනයට පෙර ලාංකික ජනතාව තුළ පැවති ආගමික ඇදහිලි 02ක් සඳහන් කරන්න.

(ix) සංඝමිත්තා මහරහත් තෙරණින් වහන්සේ ලක්දිවට වැඩම කළේ කිනම් පුර පසළොස්වක් පෝ දිනක ද?

(x) මෙම ප්‍රශ්න විචාරත්මක වැඩසටහන තුළින් ඔබ ලත් අත්දැකීම් 02ක් සඳහන් කරන්න.

(ලකුණු 2 x 10 = 20)

(02) (i) නියාම ධර්ම 5කි. ඉන් දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(ii) එම නියාම ධර්මවලින් එකක් හඳුන්වන්න. (ලකුණු 3)

(iii) කුසල කර්ම කිරීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන 5ක් ලියන්න. (ලකුණු 5)

(03) (i) බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාව නම් කරන්න. (ලකුණු 2)

(ii) තෘෂ්ණාවේ ප්‍රභේද තුන පිළිවෙළින් ලියන්න. (ලකුණු 3)

(iii) චතුරාර්ය සත්‍යය ඉගෙන ගැනීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන 5ක් ලියන්න. (ලකුණු 5)

(04) (i) අක්කොච්ඡි මං අවධි මං

..........................................................

..........................................................

වේරං තෙසං න සම්මති

ඉහත සඳහන් ධම්මපද ගාථාවේ ඉතිරි පේළි දෙක සම්පූර්ණ කරන්න. (ලකුණු 2)

(ii) එම ගාථාවේ අර්ථය නිවැරදි ව ලියන්න. (ලකුණු 3)

(iii) ඉහත ධම්මපද ගාථාවෙන් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(ලකුණු 5)

71068

(05) (i) තුලාධාරික පුද්ගලයා යනු කවුරුන් ද? (ලකුණු 2)

(ii) සිගාලෝවාද සූත්‍රයට අනුව ධනය පරිහරණය කරන ආකාරය දක්වන්න. (ලකුණු 3)

(iii) "භෞතික ලෝකයේ සීමිත සම්පත් නිසි කළමණාකරණයෙන් යුතු ව භාවිත නො කිරීමෙන් ඇති වන ගැටළු 5ක් ලියන්න. (ලකුණු 5)

(06) (i) පංච ශීලයෙහි සඳහන් විරතිය හා සමාදානය කෙටියෙන් දක්වන්න. (ලකුණු 2)

(ii) පංච ශීලය සුරැකීමේ දී යොමු විය යුතු අංග 3ක් දක්වන්න. (ලකුණු 3)

(iii) පන්සිල් සුරැකීමෙන් සමාජයට සිදු වන යහපත පැහැදිලි කරන්න. (ලකුණු 5)

(07) (i) මිච්ඡා ආජීව යන්නෙහි අර්ථය කුමක් ද? (ලකුණු 2)

(ii) ආජීව අෂ්ටමක සීලයෙහි පංචශීලයට අයත් නොවන සිල් පද 3ක් ලියන්න. (ලකුණු 3)

(iii) මිච්ඡා ආජීවයෙන් තොරව කටයුතු කිරීමෙන් සැලසෙන යහපත දක්වන්න. (ලකුණු 5)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

Answer

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 07 | විෂයය / பாடம் / Subject | බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | I ,II | පිළිතුරු පත්‍රය |
|---|---|---|---|---|---|---|

## I කොටස

| | | | |
|---|---|---|---|
| (01) - 3 | (06) - 3 | (11) - 4 | (16) - 1 |
| (02) - 1 | (07) - 4 | (12) - 2 | (17) - 4 |
| (03) - 3 | (08) - 1 | (13) - 2 | (18) - 1 |
| (04) - 2 | (09) - 2 | (14) - 1 | (19) - 3 |
| (05) - 2 | (10) - 1 | (15) - 2 | (20) - 2 |

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

(01) (i) (19 පාඩම) මහින්දාගමනයෙන් අප ලද දායාද (ලකුණු 2)

(ii) ලියා ඇති පිළිතුර සලකා බලා ලකුණු පිරිනමන්න. (ලකුණු 2)

(iii) ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල යන රහතන් වහන්සේලා අතරින් නම් දෙකක් (ලකුණු 2)

(iv) දේවානම්පියතිස්ස රජතුමා (ලකුණු 2)

(v) * නිවැරදි අර්ථවත් දිවි පෙවෙතක්, ජනතාවට හිමිවීම.
* බුදු දහමින් පෝෂිත චාරිත්‍ර වාරිත්‍ර සහ සිතුම් පැතුම් පද්ධතියක් ගොඩනැඟී තිබීම.
* ජන ජීවිතයට සතර බ්‍රහ්ම විහරණ එක් වීම.
* රාජ්‍ය පාලකයින්ට දස රාජ ධර්ම, සතර සංග්‍රහ වස්තු වැනි බෞද්ධ ඉගැන්වීම් හිමිවීම (ලකුණු 2)

(vi) තුනකි. (ලකුණු 2)

(vii) බුදුදහමය. (ලකුණු 2)

(viii) මලවුන් ඇදහීම ගස්, ගල්, පර්වතවලට වැඳීම, යක්ෂ වන්දනාව.
දෙවියන්ට පුද පූජා පැවැත්වීම (ලකුණු 2)

(ix) උඳුවප් පුර පසළොස්වක් පෝ දින (ලකුණු 2)

(x) ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 2)

(ලකුණු 2 x 10 = 20)

(02) (i) උතු නියාම, බීජ නියාම, කම්ම නියාම, ධම්ම නියාම, චිත්ත නියාම (ලකුණු 2)

(ii) 15 පාඩම පිටු අංක 111 සිට 113 දක්වා (7 ශ්‍රේණිය බුද්ධ ධර්මය) (ලකුණු 3)

(iii) ලියා ඇති කරුණු සලකා ලකුණු පිරිනමන්න. (15 පාඩම, 7 ශ්‍රේණිය, බුද්ධ ධර්මය) (ලකුණු 5)

(03) (i) දම්සක් පැවතුම් සූත්‍රය (ලකුණු 2)

(ii) කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා (පිළිවෙල තිබිය යුතු ය.) (ලකුණු 3)

(iii) ජීවතාවබෝධය ලැබීම, ගැටළු නිරාකරණය කර ගැනීම, දුක පිළිබඳ තේරුම් ගැනීම, දුකින් මිදීමේ මග තේරුම් ගැනීම, තණ්හාව දුරු කර ගැනීම ආදී කරුණු (ලකුණු 5)

**Answer**

(04) (i) අජිනි මං අහාසි මේ
යේ තං උපනය්හන්ති (ලකුණු 2)

(ii) අසවලා මට බැන්නේය, මට පහර දුන්නේය, මා පරාජය කළේ ය, මා සතු දෙය පැහැර ගත්තේ ය. යනුවෙන් යම් අය නැවත නැවත නොසිතත් නම්, ඔවුන්ගේ වෛර සන්සිඳේ. (ලකුණු 3)

(iii) ලියා ඇති පිළිතුර සලකා බලා ලකුණු පිරිනමන්න. (පෙළපොතේ 07 පාඩම පරිශීලනය කරන්න.) (ලකුණු 5)

(05) (i) තම ආර්ථිකය නිවැරදිව කළමනාකරණය කර ගැනීමට හැකියාව ඇති තැනැත්තා (ලකුණු 2)

(ii) ධනය කොටස් 4කට බෙදා වැය කිරීම
1/4 ක් පරිභෝජනයට
2/4 ක් ආයෝජනයට
1/4ක් ඉතිරි කිරීම සඳහා (ලකුණු 3)

(iii) ලියා ඇති පිළිතුර සලකා බලා ලකුණු පිරිනමන්න. (20 පාඩම, 7 ශ්‍රේණිය, බුද්ධ ධර්මය) (ලකුණු 5)

(06) (i) විරතිය - අකුසලයෙන් වෙන්වීම.
සමාදානය - කුසලයෙහි නිරතවීම. (ලකුණු 2)

(ii) (i) තමා යහපතෙහි යෙදීම. හෝ (i) තමා වරදින් වැළකීම.
(ii) අන් අය යහපතෙහි යෙදවීම. (ii) අන් අය ලවා වැරදි නොකර වීම.
(iii) යහපත් කටයුතු අනුමත කිරීම හා එයට අනුබල දීම. (iii) වරද අනුමත නොකිරීම හා අනුබල නොදීම. (ලකුණු 3)

(iii) ලියා ඇති කරුණු සලකා ලකුණු පිරිනමන්න. (8 පාඩම, 7 ශ්‍රේණිය, බුද්ධ ධර්මය) (ලකුණු 5)

(07) (i) වැරදි දිවි පැවැත්ම (ලකුණු 2)

(ii) පිසුනා වාචා වේරමණී සික්ඛා....
පරුෂා වාචා වේරමණී සික්ඛා....
සම්ප්‍රලාපා වේරමණී සික්ඛා....
මිච්ඡා ආජීවා වේරමණී සික්ඛා.... (ලකුණු 3)

(iii) ලියා ඇති කරුණු සලකා ලකුණු පිරිනමන්න. (9 පාඩම, 7 ශ්‍රේණිය, බුද්ධ ධර්මය) (ලකුණු 5)